# 2 පාඩම

## ලිංග, සමාස, සන්ධි, තද්ධිත, කෘදන්ත

2.1 ලිංග

I. පහත ප්‍රකාශ නිවැරදි නම් ‘‘√’’ ලකුණ ද වැරදි නම් ‘‘×’’ ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

අ. සිදත් සඟරාවේ දැක්වෙන පරිදි සිංහලයේ ලිංග තුනක් වේ. ☐

ආ. නාම ප්‍රකෘති විමසීමේදී සිංහලයේ ලිංග 3ක් ඇති බව පෙනේ. ☐

ඇ. ‘‘ඉකිසි’’ යනු ස්වර අනමා‍ය කරණයෙන් සෑදුණු ස්ත්‍රීවාචී නාම ප්‍රකෘතියකි. ☐

ඈ. ‘‘කෙකී’’ යනු කොකාගේ ස්ත්‍රීලිංග පදයයි. ☐

ඉ. නපුංසක ලිංග බහු වචන උක්තය සමඟ යෙදෙන ආඛ්‍යාතය බහු වචන ☐

II. සුදුසු ස්ත්‍රී ලිංග පදය තෝරන්න.

අ. මාමණ්ඩි - ලේලි, නැගණිය, නැන්දණිය

ආ. සොරා - සොරී, සෙරී, සෙර

ඇ. නයා - හැපින්න, නයිහාමි, නැයිනි

ඈ. කොහා - කෙහී, කැවිඩිය, කෙවිලිය

ඉ. බඳුන - මාලුච්චි, මැසින්න, මැලිය

The National e-learning Portal for The General Education

## 2.2 සන්ධි

2.2.1 මුල් ප්‍රකාශයට වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.

අ. පෙරපර වණන් නිසි විදිනි ගලපනු සඳනම්

I. සන්ධි කාර්ය සිදුවන්නේ මුල් පදයේ අග අකුර හා අග පදයේ අග අකුර අතරය
II. මුල් පදයේ මුල් අකුර හා අග පදයේ මුල් අකුර අතරය
III. මුල් පදයේ අග අකුර හා අග පදයේ මුල් අකුර අතරය
IV. මුල් පදයේ මුල් අකුර හා අග පදයේ මුල් අකුර අතරය

ආ. "සර දෙස් සඳ" නම්

I. මුල් පදයේ අග හා අග පදයේ මුල් ස්වර වෙනුවට ස්වරයක් ආදේශ වීමයි
II. මුල් පදයේ අග හා අග පදයේ මුල් ව්‍යඤ්ජන වෙනුවට ස්වරයක් ආදේශ කිරීමයි
III. මුල් පදයේ අග හා අග පදයේ මුල් ස්වර වෙනුවට ව්‍යඤ්ජනයක් ආදේශ කිරීමයි
IV. මුල් පදයේ මුල හා අග පදයේ මුල ඇති ස්වර වෙනුවට ස්වරයක් ආදේශ වීමයි

ඇ. පොල් + අත්ත = පොල්ලත්ත යනු,

I. පෙර රූ සඳය
II. දෙ රූ සඳය
III. පර රූ සඳය
IV. අගම් සඳය

ඈ. වැරදි ප්‍රකාශය තෝරන්න.

I. පවතින අකුරක් ඉවත් කොට වෙනත් අකුරක් ගෙන ඒම ආදේශයයි
II. පවතින අකුරුවලට හානි නොකොට අලුතෙන් අකුරක් ගෙන ඒම ආගමයයි
III. පවතින අකුරක් ඉවත්කොට පද දෙක ගැලපීම ලෝපයයි
IV. පවතින අකුරු ඉවත් නොකොට වෙනත් අකුරක් ගෙන ඒම ආදේශයයි

2.2 II A කොටසේ දක්වා ඇති සන්ධි පදයේ නිවැරදි විසන්ධි පදය B කොටසින් තෝරන්න.

| A | B |
|---|---|
| අ. නෙළුම් මල් | - නෙළුම් + මල්, නෙළුඹු + මල්, නෙළුං + මල් |
| ආ. රුක්කත්තන | - රුක් + කත්තන, රුක් + අත්තන, රුක + අත්තන |
| ඇ. වත්තම් | - වත් + කම්, වත් + අම්, වත් + කම් |
| ඈ. දිගැසිය | - දිගු + ඇසිය, දිග් + ඇසිය, දිගැ + සිය |
| ඉ. පුනරුක්තිය | - පුන + උක්තිය, පුන + රුක්තිය, පුනර් + උක්තිය |

## 2.3 සමාස

**ක්‍රියාකාරකම**

අවිධිමත් ලෙස විසිරී ඇති විග්‍රහ වාක්‍ය අදාළ අත්තෙහි ස්ථානගත කරන්න. (වැරදි කොලය ගෙනා විට එය නැවත පසු තැනට සවි විය යුතුය)

ඉහත විග්‍රහ වාක්‍යවලට ගැලෙපන සමාස පද සහිත ෙකාටුෙවන් ගැලෙපන උදාහරණය තෝරා මල්පෙති තුළ යොදන්න.

කොළවල යෙදිය යුතු විග්‍රහ වාක්‍යය

1. කිරි ද පැණි ද
   රන් ද රිදී ද
   මව් ද පිය ද
   ගස් ද වැල් ද
   ඉර ද හඳ ද
   — දකාරාර්ථ අත්ත

2. අයහපත් ජනයා - (දුදන)
   ඉතා පිරිසිදු - (සුපිරිසිදු)
   කුසල් නොවන - (අකුසල්)
   ප්‍රමාණයක් නොමැති - (අමිත)
   මනා සිල් ඇති - (සුසිල්)
   — අව්‍ය සමාසය

3. අඳුරු වූ කුටිය
   සිල් පහක් ඇති
   සඳක් වැනි වත
   කමලක් වැනි වත
   මලක් වැනි හිනාව
   — විශේෂණ සමාස අත්ත

4. බල දහයක් ඇති - දසබල
   නෙත් තුනක් ඇති - තිනෙත්
   ඉර නැගෙන දිශාව - නැගෙනහිර
   හිස් දහයක් ඇති - දසිස්
   තුරු සුන් වූයේ යමකින් ද එය - සුන්තුරු
   — අන්‍යාර්ථ අත්ත

5. කිරෙන් පිසූ බත් - කිරිබත්
   වනෙහි මල් - වන මල්
   සොරුන්ගෙන් වන බිය - සොර බිය
   පිනට දෙන හාල් - පිංහාල්
   ගත් කරනුයේ - ගත්කරු
   — විභක්ති සමාස අත්ත

The National e-Learning Portal for The General Education

| | | | | | |
|---|---|---|---|---|---|
| කිරි පැණි | රන් රිදී | මව් පිය | ගස් වැල් | ඉර හඳ | දුදන |
| සුපිරිසිදු | අකුසල් | අමිත | සුසිල් | අඳුරු කුටිය | පන්සිල් |
| සඳවත | වත කමල | මල් හිනාව | දස බල | තිනෙත් | නැගෙනහිර |
| දසිස් | සුන්තුරු | කිරි බත් | වනමල් | සොරබිය | පිංහාල් |
| ගත්කරු | | | | | |

The National e-learning Portal for The General Education

## 2.4 ප්‍රත්‍යයාර්ථ නාම

ශබ්ද ප්‍රකෘතියකට හෝ ධාතු ප්‍රකෘතියකට විශේෂ අර්ථ සහිතප්‍රත්‍යයක් එක් කොට තනාගනු ලබන ද්විතීයික නාම ප්‍රත්‍යාර්ථ නාම නමින් ගැනේ. එහි ප්‍රධාන ප්‍රභේද 2 කි.

ශබ්ද ප්‍රකෘතියකට තද්ධිත ප්‍රත්‍යයක් එක්කර තද්ධිත නාම වෙයි.

ගම් + ඉ = ගැමි

තොට + ඉ = තොටි

ධාතු ප්‍රකෘතියකට කෘදන්ත ප්‍රත්‍යයක් එක්කර කෘදන්ත පද සාදා ගනියි.

කර + න = කරන

නට + උම් = නැටුම්

**ක්‍රියාකාරකම්**

2.4 I) දී ඇති වගුවේ මැද කොටසේ තද්ධිත හා කෘදන්ත පද රාශියක් අවිධිමත් යෙදී ඇත. ඒවායින් තද්ධිත පද A කොටසේ ද කෘදන්ත පද B කොටසේද ස්ථානගත කරන්න.

| A | | B |
|---|---|---|
| අම්මණ්ඩි<br>තාරුණ්‍යය<br>සංස්කෘතික<br>ස්වදේශීය<br>නීරෝගිමත්<br>දෛනික<br>නැකති<br>දක්ෂතා<br>යසස්<br>ස්වර්ණමය | ලියුම<br>අම්මණ්ඩි<br>තාරුණ්‍යය<br>සැරසිලි, නැගෙන<br>නැවුම<br>සංස්කෘතික<br>බිණීම්<br>ස්වදේශිය<br>නීරෝගිමත්<br>ලියන්නා, යසස්<br>දෛනික, දක්ෂතා<br>ලෙළෙන, නැකති<br>වැටිණ, කියමන්<br>රැගුම, ස්වර්ණමය | ලියුම<br>සැරසිලි<br>නැටුම්<br>බිණීම්<br>ලියන්නා<br>ලෙළෙන<br>වැටිණ<br>කියමන්<br>නැගෙන<br>රැගුම |

2.4 II) දී ඇති පද ගොනු අතුරින් තද්ධිත පදය තෝරා එය පහතින් ඇති මල්ල තුළ යොදන්න.

තටු

කටු, වකුටු, නටු, පටු

වැටි

නැටි, පැටි, තොටි, මැටි

උසස්, සකස්, මහුලස්, උකස්, අල්ලස්




පලු, මලු, වලු, ගැටලු, තලු

පනිති

නටති, සිඟිති, සිඳිති, සිඟති

2.4 මුලින් දැක්වෙන කෘදන්ත පදය හා සුදුසු ප්‍රකාශය යා කරන්න.

අ)

| | |
|---|---|
| වැයුම් | අතීත කෘදන්තයකි |
| වයන | වර්තමාන කර්මකාරක කෘදන්තයකි |
| වැයුණු | භාවකාරක කෘදන්තයකි |
| වැයෙන | වර්තමාන කර්තෘකාරක කෘදන්තයකි |

ආ)

| | |
|---|---|
| නමන | වර්තමාන කාල කර්මකාරක කෘදන්තයකි |
| නැමුණු | වර්තමාන කර්තෘකාරක කෘදන්තයකි |
| නැමිලි | අතීත කාල කෘදන්තයකි |
| නැමෙනා | භාවකාරක කෘදන්තයකි |

ඇ)

| | |
|---|---|
| කියවීම් | වර්තමාන කර්මකාරක කෘදන්තයකි |
| කියනා | අතීත කාල කෘදන්තයකි |
| කියවිණි | භාව කාරක කෘදන්තයකි |
| කියවෙන | වර්තමාන කර්තෘකාරක කෘදන්තයකි |

ඈ)

| | |
|---|---|
| රැගුමන් | වර්තමාන කර්ම කාරක කෘදන්තයකි |
| රඟනු | අතීත කෘදන්තයකි |
| රැගුණු | වර්තමාන කර්තෘකාරක කෘදන්තයකි |
| රැඟෙනු | භාව කාරක කෘදන්තයකි |

ඉ)

| | |
|---|---|
| පිහිටෙනා | භාව කාරක කෘදන්තය |
| පිහිටීම් | වර්තමාන කර්මකාරක කෘදන්ත |
| පිහිටනා | අතීත කෘදන්තයකි |
| පිහිටිණි | වර්තමාන කර්තෘකාරක කෘදන්තයකි |

e-තක්සලාව The National e-Learning Portal for The General Education